14 වන පිටුවෙන් (අදිසි)

වත් හානියක් කරන්න... ඒකයි මං මේ ප්ලෑන් එකට විතරක් හිතන්න බැරි ගාණක් වියදම් කළේ.. මේ හෝටලේ හදලා ඉවර වුණාම ඒක කොන්ක්‍රීට් ගොඩනැගිල්ලක් හැටියට නෙවෙයි මේ පරිසරයේම ස්වභාවික දෙයක් හැටියට පෙනේවි.. මට ඒක සීයට සීයක් විශ්වාසයි.. මේ දැනුත් මං මිස්ටර් ප්‍රනාන්දු එක්ක කතා කළෙත් මේ ගැනම තමයි"

සුනන්ද පහළට බැස ගල් තලයේ වැදී විසිරෙන සිසිල් දියෙන් දෝතක් ගෙන මුහුණ දොවා ගනියි. එතැන සිට හැරී බලන ඔහුට සිනාසෙමින් බලා සිටිනා වින්ධ්‍යා පෙනෙයි. මේ දිය දෝතකින් ඇය තෙමා කවට කමක් කරන්නට ඔහුට සිතෙයි. කුසල් නොසිටියා නම් ඒ දඟකාර කම කරන්නට හොඳටම ඉඩ තිබුණි.

"සුනන්ද අයියා මෙතන නවතින්න ඕනෙ නැහැ.. ඔයාට පුලුවන් නුවර මහගෙදර ඉඳන් උදේ හවා එන්න යන්න.. මගේ ඩබල් කැබ් එක මං ඔයාට දෙනවා.. මාස දෙකක් ඇතුළත මේ ඔක්කොම ඉවර කරලා අපට බාර දෙන්න ප්‍රනාන්දු පොරොන්දු වුණා.. ඒ කාලය අපට ඇති අපේ අනිත් වැඩ කටයුතු ලෑස්ති කරගන්න.." කුසල් කතා කරන්නෙ දැඩි ආත්ම විශ්වාසයකිනි. ඒ කතා ස්වරූපය සුනන්දගේ සිත් ගනියි. කුසල් දැඩි අධිෂ්ඨානයකින් ඉදිරියට යන මිනිසෙකි. අහසට පොළොව මෙන් ගතිගුණ වලින් වෙනස් වුව ද ඒ අතින් ඔහු රණසිංහට සමාන ය. "..සුනන්ද අයියටයි මටයි මේ හොටෙල් එක ගොඩ දාගන්න එක ඒ හැටි වැඩක් වෙන්නෙ නැහැ"

"ඇයි ඔය දෙන්නා විතරක්.. එතකොට මට මොකද වෙන්නෙ..?" වින්ධ්‍යා සිනාසෙයි.

"ඔයාට කොළඹ ඉඳන් කරන්න පුලුවන් දෙයක් නැහැනෙ අක්කා.."

"කොළඹ...? මොන කොළඹ ද..? මං ආපහු කොළඹ යන්නෙ නෑ.."

000000000000

ගතවන මේ දින කීපය කල්පයක් සේ අයේෂාට දැනෙයි. රණසිංහ සමග කතා කරන්නට බොහෝ දේ ඇගේ සිත තුළ ඇත. මැතිවරණ කලබලය අතරේ පාක්ෂිකයන් පිරිවරාගත් රණසිංහ තනිවම කොටු කර ගන්නට අවස්ථාවක් මේ දක්වා ඇයට සොයා ගත නොහැකි විය. අනෙක් අතින් ඔහු තමා නොදුටුවා සේ මග හරියි.

ගතට දැනෙන කෙඩෙත්තුව සිතටත් දැනෙයි. සියල්ල තම ග්‍රහණයෙන් ගිලිහෙමින් තිබෙන බව පමණක් ඇයට වටහා ගත හැකි ය. රණසිංහ ගේ කාර්යාලය තුළ තමා තවදුරටත් වැදගත් චරිතයක් නොවේ ය යන්න දැනෙන විට සිතට දැනෙන්නේ වේදනාවකි.

ප්‍රඥාරත්න සමගින් මැතිවරණ කටයුතු වල යෙදෙන බැවින් අයෝමා දැන් රණසිංහ ගේ කාර්යාලයට වැඩිපුර නොපැමිණෙයි. රණසිංහ නැති වේලාවක පැමිණිය හොත් අයෝමා කෙළින්ම ගොස් වාඩි වන්නේ රණසිංහ ගේ පුටුවේ ය. එය අයේෂාගේ ඇසේ කටු අනින්නාක් මෙන් වූ දර්ශනයකි. ඈ ඉදිරියේ තමා කොයි තරම් හෑල්ලුවට ලක්ව ඇද්දැයි අයේෂා බොහෝ විට කල්පනා කරයි. හීනමානයෙන් පීඩාවට පත්වන ඇගේ දුක අසන්නට කිසිවකු දැන් මේ කාර්යාලයේ නැත. සුනන්ද නැති අඩුව ඇයට වඩාත් දැනෙන්නේ දැන් ය.

හිස කැක්කුම දරා ගත නොහැකි තරමින් ඇයට දැනෙයි. අත් බෑගයෙන් පැරසිටමෝල් පෙති දෙකක් අතට ගන්නා ඇය එය ගිල දමයි.

ඉක්මණින් යමක් කළ යුතු ය. තව දුරටත් නිහඬව සිටීම කළ නොහැක්කකි. අයේෂා දුරකතනය අතට ගනියි. තමාගේ ජංගම දුරකතනයට ඇමතුම් නොදෙන්නැයි රණසිංහ පෙරදිනෙක කියූ සැටි ඇයට මතකය. ඔහු එය කීවේ ඉල්ලීමක් ලෙස නොවේ. තරවටුවක් විලාසයෙනි. එසේ වුවද මේ කීකරුකම පවත්වාගෙන යා හැකි වේලාවක් නොවේ.

දුරකතනය අතැතිව තත්තපර කීපයක් කල්පනා කළ අයේෂා රණසිංහ ගේ ජංගම දුරකතනයේ අංකය ඔබයි.

000000000000

ලිපි ගොණුව මේස ලාච්චුවට දැමූ බලදේව බිත්තියේ සවිකර ඇති  රූපවාහිණී තිර කීපය දෙස බැල්මක් හෙලයි. සිව් මහල් ගොඩනැගිල්ලේ පහතම මාලයේ ඇති තමාගේ රටබීම හලේත් දෙවැනි මහලේ ඇති හෝටලයේත් වැඩකටයුතු කෙරෙන ආකාරය කන්තෝරු කාමරෙය් සිටම නිරීක්ෂනය කරන්නට හැකි වන සේ මේ අභ්‍යන්තර රූපවාහිණී ජාලය ඔහු සවිකරවා ගත්තේ ගිය මාසයේ දී ය. තිස්ස දෙවේලේ මිනිසුන් අතර ගැවසෙන්නේ නැතිව ඈත සිට කෙරන මේ පාලනය ආරක්ෂාවට ද හොඳ ය.

කිසිවකු දොරට තට්ටු කරනු ඇසෙයි.

"සර්.. රණසිංහ මන්ත්‍රී තුමා ආවා..." ගුණපාල දොරෙන් එපිට සිට කියයි.

බලදේව ගේ මුවගට සිනාවක් නැගෙයි. සියල්ල නිසි අයුරින් සිදුවෙමින් තිබීම පිළිබඳ තෘප්තියෙන් නැගුණ සිනාවකින් යුතුව ඔහු පිලිතුරු දෙයි.

"උඩ ලොබියට එක්ක යනවා.. මං එන්නං.."

බලදේව කාමරයේ බිත්තියට සවි කර ඇති සේප්පුවේ දොර ඇර එතුළ ඇති මුදල් මිටි දෙස ටික වේලාවක් බලා සිටියි. එයින් මිටි දෙකක් සාක්කුවට දමා ගන්නා  ඔහු කාමරයෙන් පිටවන්නේ හින්දි ගීයක තාලයක් උරුවම්බාමිනි.

"මේ තරම් වැඩ අස්සෙත් ඔබතුමා වෙලාවට වැඩ කරන එක නම් මට හිතාගන්නත් බැහැ.." බලදේව රණසිංහ ඉදිරියේ වූ හිස් අසුනේ වාඩි වෙයි. "ඉතිං අපේ මන්ත්‍රීතුමා ..ලොකු හාමුදුරුවො මොකද කියන්නෙ..? දැන් මොනාද තව මගෙන් කෙරෙන්න ඕනෙ...? අපි පන්සලේ බණ මඩුවත් මේ එක්කම හදලා දාමු ද..? ඔබතුමා කියනවා නං මම ඔය බණ මඩුව බිමටම සමතලා කරලා අලුතින්ම එකක් හදන්න සල්ලි දෙන්නං"

රණසිංහ කොක් හඬ දී සිනාසෙයි.

"පිස්සු කතා කරන්න එපා මනුස්සයො.. ඔහේ ඔය පින් කර ගත්තා ඇති.. ඊළඟ පාර ඡන්දෙටත් මොනා හරි ඉතුරු කරගන්න ඕනෙනෙ.. මේ සැරේට ඔය මදෑ.. අනිත් වැඩ ටික අමතක කරන්න එපා"

සේවකයකු විසින් ගෙන එනු ලබන මත් පැන් බෝතලයෙන් වීදුරුවක් පුරවා ගන්නා රණසිංහ සුබ පැතීමකින් තොරව ම එයින් උගුරක් බොයි. වීදුරුව මේසය මත තබා බලදේව දෙස එබී බලයි.

"මේ නං හරිම ජරා සෙල්ලමක් බං..."

රණසිංහ ගේ ජංගම දුරකතනය නාද වෙයි. දුරකතනයේ තිරය මත දිස්වන්නේ තමාගෙ කාර්යාලයේ අංකය යි. අතින් සන් කර බලදේවගෙන් අවසර ගන්නා ඔහු දුරකතන ඇමතුමට සවන් දෙයි.

සිය වීදුරුවට තවත් මත් පැන් වඩියක් පුරවා ගන්නා බලදේව රණසිංහ දෙස බලයි. මන්ත්‍රීවරයා ගේ මුහුණ අසාමාන්‍ය ලෙස අඳුරු වනු ඔහුට පෙනෙයි.

රණසිංහ දුරකතනය වහා විසන්ධි කරයි. ඔහුගේ නළලත නැගී ඇති සිහින් ඩා බිඳු බලදේවට හොඳින් පෙනෙයි.

"ඇයි සර්.. කරදරයක් ද..?"

රණසිංහ දුකතනය සාක්කුවේ දමා ගනියි. වමතින් නළල පිරිමදිමින් බලදේව දෙස බලයි.

"මොකක්ද බලදේව ඇහුවෙ..?"

"මොකක් හරි කරදරයක්ද සර්.."

"ඔව් බලදේව.. ලොකු කරදරයක්..." රණසිංහ දෙවන වාක්‍යය කියාගන්නේ තමාටම ය. "..ලොකු කරදරයක්..."

ලබන කලාපයට





ජනක කුඹුකගේ සහ අසෝක ආතාවුදහෙට්ටිගෙන් අලුත්ම වේදිකා නාට්‍යය

## "සුළඟ මට කතා කරයි"



ජනක කුඹුකගේ සහ අසෝක ආතාවුදහෙට්ටි නිර්මාණය කරන ජනක කුඹුකගේ චාන්දනී සෙනෙවිරත්න රඟන "සුළඟ මට කතා කරයි" වේදිකා නාට්‍යයේ මුහුරත් උළෙල පසුගිය දා පැවැත්වුණි

මේ එහි දර්ශන කීපයකි


## ශ්‍රී ලාංකික ඔබ වෙනුවෙන්ම

**EMAIL, WEB HOSTING, WEB DESIGN, GRAPHICS & PRINTING..**

- Email Hosting from $49/Year
- Web Hosting from $99/Year
- Web Sites from $199

Call us now !!
Get a free .com or .com.au domain !!

SATISFACTION 100% GUARANTEED

derana
derana Australia Pty Ltd

Contact : AJITH
MOB : 0430 169 036 Email: info@derana.com.au

http://derana.com.au